

# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කෑගල්ල
# සනීපාරක්ෂක සේවා සඳහා
# මිල ගණන් කැඳවීම - 2023/2024

01. කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන මණ්ඩලයේ සභාපති විසින් කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ඊට අනුබද්ධ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක් සහ කෑගල්ල දිස්ත්‍රික් මෝටර් රථ කාර්යාලය සඳහා 2023 ජනවාරි මස 01 දින සිට 2024 මාර්තු මස 31 දින දක්වා ඉහත සඳහන් සේවාව ලබා ගැනීම සඳහා අසාධු ලේඛනගත නොවූ සුදුසුකම් සපුරා ඇති සේවා සැපයුම්කරුවන්ගෙන් 2022.11.18 දින ප.ව.3.30 දක්වා ලංසු කැඳවනු ලැබේ.

02. 2022.10.31 දින සිට 2022.11.17 දින දක්වා වැඩ කරන දිනයන් වලදී පෙ.ව. 9.00 සිට ප.ව. 2.00 දක්වා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ට මෙම කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරී වෙතින් අදාළ ආකෘති පත්‍ර ලබා ගත හැකිය.

03. . ඔබගේ මිල ගණන් පිටපත් දෙකකින් යුක්තව මුල් පිටපත හා අනු පිටපත ලෙස වෙන් වෙන්ව නම්කර මුද්‍රා තබා එක කවරයක බහා ඉදිරිපත් කර 2022.11.18 දින ප.ව. 3.30 ට පෙර සභාපති, ප්‍රසම්පාදන කමිටුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට හෝ කටයුතු කළ හැකිය. මිල ගණන් ඉදිරිපත් කරන ලිපි කවරයේ වම් පස ඉහල කෙළවරේ " පවිත්‍රතා සේවාව ලබා ගැනීම - 2023/2024" යනුවෙන් සඳහන් කළ යුතුය. එම වේලාවෙන් පසුව ලැබෙන ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. එදිනම ප.ව. 4.00 ට මිල ගණන් විවෘත කරනු ලබන අතර , එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයෙකුට සහභාගී විය හැක. වැඩි විස්තර හෝ පැහැදිලි කිරීම් අවශ්‍ය වේ නම් මෙම කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරී අමතා ලබා ගත හැකිය. දු.ක.035 – 2223112

| අවශ්‍ය සේවාව | ලංසු අයදුම්පත් ලබා ගැනීම සඳහා වූ සුදුසකම් | සේවාව ලබා ගැනීමට බලාපොරොත්තු වන ආයතන | ආපසු ගෙවන ටෙන්ඩර් ඇප තැන්පත් | ලංසු ලියවිලි ගාස්තු ( ආපසු නොගෙවන) |
|---|---|---|---|---|
| 01.සනීපාරක්ෂක සේවාව සැපයීම | අදාළ ව්‍යාපාර කටයුත්ත සඳහා රජයේ ලියාපදිංචිය හා වසර 02 කට වැඩි පළපුරුද්ද | දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය, දිස්ත්‍රික් ලේකම් නිල නිවාස පරිශ්‍රය, දෙහිඕවිට, යටියන්තොට, රඹුක්කන, අරණායක, දැරණියගල, ගලිගමුව, කෑගල්ල, මාවනැල්ල, රුවන්වැල්ල, වරකාපොල, බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ කෑගල්ල දිස්ත්‍රික් මෝටර් රථ කාර්යාලය සඳහා | රු.5000.00 | රු.1000.00 |

මහින්ද එස් වීරසූරිය
දිස්ත්‍රික් ලේකම් / දිසාපති,
ප්‍රසම්පාදන මණ්ඩලයේ සභාපති,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. කෑගල්ල

දිනය 2022.10.28